CFA Institute

# වරලත් මූල්‍ය විශ්ලේෂක ආයතනය ආයෝජක අයිතිවාසිකම් ප්‍රකාශනය

කොටස් වෙළඳ පොළ ගණුදෙණු, බැඳුම්කර ඇතුළු වෙනත් මූල්‍ය සේවාවන් ලබා ගැනීමේදී ආයෝජකයකු ලෙස ඔබ, ඔබේ මූල්‍ය ආයතනය වෙතින් බලාපොරොත්තු විය යුත්තේ කෙබඳු ආකාරයක සේවාවක්ද යන්න ඔබ දැනුවත් කිරීම සදහා වරලත් මූල්‍ය විශ්ලේෂක ආයතනය (CFA Institute) විසින් “ආයෝජක අයිතිවාසිකම් ප්‍රකාශනය” සම්පාදනය කර ඇත. අන්‍යෝන්‍ය විශ්වාසය මත පදනම් වූ වෘත්තීයමය සබඳතාවක් ඔබ අතර ගොඩනැඟීම පිණිස ඔබේ මූල්‍ය ආයතනය සහ එහි සේවකයින් අනුගත විය යුතු වෘත්තීය ආචාර ධර්ම පද්ධතිය මෙමඟින් ප්‍රකාශිතය. ආයෝජන සැලසුම් කිරීම සහ එය කළමනාකරණය, වෘත්තීයමය උපදෙස්, බැංකු සේවා, රක්ෂණ සේවා සහ දේපල ආයෝජන වැනි කටයුතු වලදී ඔබේ සේවා සපයන්නා ලබා දිය යුතු තොරතුරු සහ සේවාවන් පිළිබඳව ඔබ දැනුවත් විය යුතුය. ඔබේ එවන් දැනුවත්වීම, මූල්‍ය ආයතන සහ වෘත්තිකයින් අතර පමණක් නොව, සමස්ත මූල්‍ය ක්ෂේත්‍රය  මුළුල්ලෙහිම, විනිවිදභාවය සහ විශ්වාසය තහවුරු වීමට මඟපාදයි.

## මූල්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිකයෙකුගෙන් හෝ ආයතනයකින් සේවා ලබා ගන්නා සේවා දායකයකුගේ අයිතිවාසිකම්:

1. අදාල නීති සහ රෙගුලාසි වලට අනුකූල වන **අවංක**, දක්ෂ, හා සදාචාර සම්පන්න සේවාවක් ලබා ගැනීම
2. දූරදර්ශී තීන්දූ ගැනීම සහ පුළුල්, දැනුවත් විශ්ලේෂණය මත පදනම් වූ **ස්වාධීන**, විෂය මූලික උපදෙස් ලබා ගැනීම
3. ආයතනයේ සහ වෘත්තිකයාගේ ලාභදායිත්වයට වඩා **ප්‍රමුඛත්වයක්** සේවා දායකයාගේ මූල්‍ය අවශ්‍යතාවයන්හට ලබා දීම
4. අන් සේවා ආයතන සමඟ සැසඳීමේදී **සාධාරණ** සැලකීමක් සහ සේවාවක් ලබා ගැනීම
5. සේවා දායකයාහට ප්‍රතිලාභ ලබා දීම සහ මූල්‍ය ආයතනයේ හෝ වෘත්තිකයාගේ  අවශ්‍යතා පිළිබඳ **ගැටුමක්** පවතින්නේ නම්  ඒ පිළිබඳ දැනුවත් වීම
6. සේවා දායකයාගේ මූල්‍යමය අවශ්‍යතා පිළිබඳව **මනා අවබෝධයකින්** යුතුව ඒ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා වඩාත්ම සුදුසු උපදෙස් ලබා ගැනීම
7. පැහැදිලි, නිවැරදි, සම්පූර්ණ සහ කාලීන **තොරතුරු**, සරල බසින්, පහසුවෙන් වටහාගත හැකි ආකෘතියකින් ලබා ගැනීම
8. ගාස්තු සහ **අයකිරීම්** සහ ඒවායේ සාධාරණ බව පිළිබඳව පැහැදිලි විස්තර ලබා ගැනීම
9. සේවා දායකයාගේ සියලු තොරතුරු වල **රහස්‍යභාවය** ආරක්ෂා වීම
10. සේවා දායකයා වෙනුවෙන් සිදු කල කාර්යන් පිළිබඳ නිවැරදි හා සම්පූර්ණ  **වාර්තා** ලබා ගැනීම

**Visit cfainstitute.org/futurefinance**

© 2018 CFA Institute. All rights reserved.

සිංහල පරිවර්තනයකි